

# ප්‍රියංකර ප්‍රාර්ථනා කරන්නේ මගේ පුතා වෙන්න.

- දිල්හානි ඒකනායක

**මේ දවස්වල මොකද කරන්නෙ ?**

සිරස නාලිකාවෙන් නිෂ්පාදනය කරන Film එකේ රූගත කිරීම් කෙරෙනවා. සිවදාසන්ගේ අලුත් චිත්‍රපටයටත් ආරාධනා ලැබිලා ඒ ගැන කතාබහ කරගෙන යනවා. චරිත් අබේසිංහගේ ශිද්දලයා සහ ලක්මිණි අමරදේවගේ ඉස්කෝලෙ ගෙදර කියන ටෙලිනාට්‍ය වලත් රඟපානවා.

**සිනමා නිළියක් ටෙලි නාට්‍යවලින් දකින්නට ලැබීම, සිනමාව තුළ ගොඩ නගා ගත් ප්‍රතිරූපය පහත වැටෙන්න පුළුවන් නේද?**

ඔව්, පහත වැටෙන්න පුළුවන් මගේ ප්‍රියතම ධාරාව සිනමාව, වැඩිපුරම රඟපාන්නේ ඒ තුළ, රංගනය වෘත්තිය කරගත්ත කෙනෙක්ට සිනමාව මත පමණක් යැපෙන්න බැහැ.

**ඔබ සිනමාව තුළ ප්‍රවීණ, නවක අධ්‍යක්ෂකවරු සමඟ ගණුදෙනු කරනවා. මේ පරිශීලනය තුල ඔබේ දායකත්වය කොහොමද ?**

ඇත්තටම කිසිවෙක් සමග ගැටීමක් ඇතිවෙන්නෙ නැහැ. මොකද මම නිර්මාණයකට යනකොට යන්නේ ඒ Directorගේ විදිහ හඳුනගෙන, ඔහුට මගෙන් වුවමනා දෙය මම දන්වා. එතැනදී මම හැසිරෙන විදිහත් දන්නවා. ප්‍රසන්න විතානගේට මාව වුවමනා විදිහ වගේම කැලුම් පාලිතට රිදී තිරයට මාව වුවමනා සුන්දරත්වය මම ඉතාම හොඳින් දන්නවා. ඒ නිසා මෙතෙක් මට ගැටලුවක් කිසිවෙක්ගෙන් වෙලා නැහැ.

**වර්තමානයේ ඇතැම් නවක නිළියන් කියනවා ප්‍රවීණයන්ගෙන් ඔවුන්ට සහයෝගක් නැහැ කියලා. ඔබටත් එහෙම කාලයක් තිබුනද?**

සිනාසෙමින්) ඇත්ත එහෙම දේවල් නොතිබුනා නෙවෙයි. ඒත් මම ඒවා හිතේ තියාගෙන් ...න්නෙ නැහැ. ඒත් මගේ අම්මාට නම් ඒවා තවමත් හොඳට මතකයි. ඒ කාලේ වුනත් මම ...ලාකුවට කිසිම කෙනෙක් ඇසුරු කරපු කෙනෙක් නෙවෙයි. මං ආව කාලෙම වගේ ක්-ෂේත්‍රයට ආව ඩිලානි, රන්ජන් අයියා, ශෂි අයියා වගේ අය එක්ක තමයි උත්සවයකට ගියත් ...ඟින් හිටියෙ.

**සිනමා පාසලක පුරප්පාටුව ගැන බහුලව කතා කරනවා. නමුත් මේ වනතුරුත් ඒ පුරප්පාටුව පුරවලා නැහැ. ප්‍රවීණ ශිල්පින්යක් විදිහට ඒ පිළිබඳව නිහඬ ඇයි ?**

...ම රංගන පාසලකට ගිය කෙනෙක් නෙවෙයි. මට අධ්‍යක්ෂවරයාගේ මෙහෙයවීමට නතුවුන ...ිළියක් වගේම සමාජය දිහා විවිධ කෝණවලින් බලලා මා තුළින් ලෝකය හොයන කෙනෙක්. ...ම විශ්වාස කරනවා හොඳ රංගන ශිල්පියෙක්/ ශිල්පිනියක් වෙන්න හොඳින් පොළවෙ ...යගහලා ජීවත් වෙන්න ඕන, සමාජය හැදෑරීමක් තියෙන්න ඕන කියලා. එහෙම නැතුව ...ේකප් දාගෙන කොණ්ඩ මෝස්තර දාගෙන විතරක් හොඳ නළු නිළියෙක් වෙන්න බැහැ. ...ිනමා පාසල කියන සංකල්පය හොඳයි. ප්‍රතිභාව තුළ ගේන දේ ඉගෙන ගන්න පුළුවන් ...ැනක් තියෙනවානම් හොඳයි. ආනෝජා අක්කා තමයි මම දන්න තරමින් දැනට ඒ පිළිබඳව ...ැපවීමකින් උගන්වන්නෙ.

**ඔබ දේශපාලනිකද ?**

...ව් මට දේශපාලනයක් තියෙනවා. ලෝකෙ ගැන දැක්මක් තියෙනවා. දේශපාලනය කියන්නෙ ...න්දය දීම කියන එක නෙවෙයි.

**ඔයා වඩා කැමති හොඳ බිරිඳක් කියනවටද හොඳ මවක් කියනවටද?**

...ියංකර වුනත් කියන්නේ මම හොඳ අම්මා කෙනෙක් කියලා. එයා මේ ළඟදීත් කිව්වා එයා ...ාර්ථනා කරන්නේ ලබන ආත්මෙක මගේ Husband වෙන්න නෙවෙයි, මගේ පුතා වෙන්න ...ියලා. සමහර අවස්ථාවලදී Wife කියන තැනදී මම Fail කියලා දැනුන තැන් තියෙනවා. ඒත් ...ම්මා කියන තැන මම උඩින් ඉන්නවා.

**පසිඳු' ගැනත් කියමු නේද?**

...සිඳු මට නොදැක ඉන්න බැරි දසුන, පුතා මේ දවස්වල ඇමරිකාවේ ඉන්නෙ උසස් අධ්‍යාප-...යට ගිහින්. සංගීතයට තමයි කලාව පැත්තෙන් එයා දක්ෂ. ඒත් එයා කියන්නේ සංගීතය ...ුනත් හරියට ඉගෙන නොගෙන කරන්නේ නැහැ කියලා. ජීවිතය ගැන හොඳ අවබෝධයක් ...ියෙන,මනුස්සකමින් පිරුණ පොළවෙ පයගහලා ඉන්න දරුවෙක් එයා. ඒක මට ලොකු ...තුටක්.



මාෂා විස්වාශිනී